**ශ්‍රී ලංකා මෝටර් රථ ක්‍රීඩා සම්මේලනය - 2021**

**------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. අහිතකර මතය

ශ්‍රී ලංකා මෝටර් රථ ක්‍රීඩා සම්මේලනයේ ("සම්මේලනයේ" ) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශය, සමුච්චිත අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සිදුකිරීම සඳහා පොදු පරිචයේ යෙදෙන වරලත් ගණකාධිකාරීවරුන්ගේ සමාගමක් විසින් මට සහාය වන ලදි.

මගේ මතය අනුව, මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන්, මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SMEs සඳහා SLFRS) අනුව 2021 දෙසැම්බර් 31 දිනට සම්මේලනයේ මූල්‍ය තත්ත්වය සහ එහි වර්ෂය සඳහා වූ එහි මුදල් ප්‍රවාහයන් මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ සත්‍ය සහ සාධාරණ තත්වයක් පිළිඹිබු නොකරයි

### 1.2 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණු මත පදනම්ව මා විසින් අහිතකර මතයක් නිකුත් කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මගේ අහිතකර මතයට පදනමක් සැපයීමට මා ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ සුදුසු බව මම විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සම්මේලනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සම්මේලනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සම්මේලනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සංගමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- සම්මේලනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සම්මේලනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සම්මේලනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සම්මේලනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සම්මේලනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සහ
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනයක් සංගමය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. එබැවින් ස්ථාවර වත්කම්වල පැවැත්ම, නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. | සම්මේලනයේ අදහස් දැක්වීම ඉදිරිපත් කර නොතිබුණි. | ජංගම නොවන වත්කම්වල පැවැත්ම තහවුරු කිරීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනය නිසි ලෙස නඩත්තු කළ යුතුය. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (i) | ආදායම් | 5,800,655 | යොමු රිසිට්පත් සහිත සාමාජිකයින්ගේ ලියාපදිංචි ලේඛන | සම්මේලනයේ අදහස් දැක්වීම ඉදිරිපත් කර නොතිබුණි. | ආදායම සත්‍යාපනය කිරීම සඳහා ප්‍රමාණවත් විගණන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ii) | වියදම් | 5,220,000 | ඉන්වොයිසි | සම්මේලනයේ අදහස් දැක්වීම ඉදිරිපත් කර නොතිබුණි | වියදම සත්‍යාපනය කිරීම සඳහා ප්‍රමාණවත් විගණන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (iii) | ආපසු ගෙවිය යුතු තැන්පතු | 375,000 | ශේෂ තහවුරු කිරීම් | සම්මේලනයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි | වගකීම් සත්‍යාපනය කිරීම සඳහා ප්‍රමාණවත් විගණන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (iii) | ගෙවියයුතු වියදම් | 212,880 | ස්වාධීන තහවුරු කිරීම් | සම්මේලනයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | වගකීම් සත්‍යාපනය කිරීම සඳහා ප්‍රමාණවත් විගණන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ ) 2020 වර්ෂයේ රු. 180,000 ක ආදායමක් සහ 2022 වර්ෂයේ ආදායම් රු.270,000 ක සමාලෝචිත වර්ෂයේ අදායම් ලෙස දක්වා තිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල ආදායම රුපියල් 450,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | සම්මේලනයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතුය. |
| පූර්ව වර්ෂයේ අනුචිත ගැලපීම් සිදු කිරීම හේතුවෙන් ආරම්භක සමුච්චිත අරමුදල් රු. 26,897 ක් අඩුවෙන් දක්වා තිබුණි. | **සම්මේලනයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි.** | මූල්‍ය ප්‍රකාශනයට අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය තුළ ලැබිය යුතු ලෙස රු. 7,981 ක නොසැසැදූ ශේෂයක් සටහන් කිරීම නිසා සංගමයේ වත්කම් වර්ෂය අවසාන කාලය සඳහා එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි. | සම්මේලනයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතුය. |
| (ඇ)වර්ෂය සඳහා ක්ෂයවීම් සහ සමුච්චිත ක්ෂයවීම්වල ආරම්භක ශේෂය පිළිවෙළින් රු. 19,238කින් සහ රු. 25,289කින් වැඩියෙන් දක්වා තිබුණි. | **සම්මේලනයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි.** | මූල්‍ය ප්‍රකාශනයේ අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු. 1,026,000 ක අනෙකුත් ලැබිය යුතු ශේෂ වසර 04 කටත් වැඩි කාලයක් සිට ආපසු අයකර නොගෙන හිඟව පැවතුන අතර ඒ සඳහා මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදු කර නොතිබුණි. එසේම ස්වාධීන තහවුරු කිරීම් වැනි ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සම්මේලනයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතු අතර මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතුය. එසේම, ලැබිය යුතු මුදල් සත්‍යාපනය කිරීම සඳහා ප්‍රමාණවත් විගණන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**2.** මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,008,789 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 557,834. ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,566,623 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රු.3,704,770 වියදම් වැඩිවීමට වඩා ආදායම රුපියල් 5,196,655 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.